**මන්නාරම ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්නාරම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ශුද්ධ පොලී ආදායම් රු.398,969ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | නිලධාරීන් 03කට ලබානොදුන් ආපදා ණය මුදල් රු.750,000ක්, ලබාදුන් බවට වියදමක් ලෙස හා විවිධ ණයගැතියන් ලෙසත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි පිළිවෙත් අනුගමනය නොකරන බව. | -එම- |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට පරිභෝජන භාණ්ඩ ශේෂය රු. 1,455,748ක් ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස හා පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණි. එසේම, ඉඩම් මිලදී ගැනීමට අදාල නීතිඥ ගාස්තු හා මුද්දර ගාස්තු එකතුව රු.100,000ක් ශේෂ පත්‍රයේ ඉඩම් වටිනාකම යටතේ දැක්වීම වෙනුවට පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරන බව. | -එම- |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි කල් ඉකුත් වූ රු.407,620ක තැන්පතු 35ක් නිරවුල් කර නොතිබුණි. | ආදායමට මාරුකිරීමට පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 20,004,324 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 33,728,619 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 92,318 | 92,318 | 3,168 | 179,582 | 92,318 | 92,318 | 1,886 | 90,432 |
| කුලී | 12,616,338 | 11,497,067 | 11,329,586 | 4,046,564 | 13,030,657 | 12,795,086 | 12,275,042 | 3,879,083 |
| බලපත්‍ර ගාස්තු | 935,500 | 12,831,500 | 12,831,500 | - | 2,460,650 | 1,375,359 | 1,375,359 | - |
| වෙනත් ආදායම් | 18,333,061 | 17,953,168 | 1,098,408 | 23,442,162 | 13,532,660 | 27,631,877 | 27,631,877 | 6,587,402 |
| එකතුව | 31,977,217 | 42,374,053 | 25,262,662 | 27,668,308 | 29,116,285 | 41,894,640 | 41,284,164 | 10,556,917 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂ 02 ක සිට වර්ෂ 13ක් දක්වා කාලයක් පැරණි වරිපනම් හා බදු, කඩකුලී සහ ජේසීබී, මෝටර් රෝලර්, මෝටර් ග්‍රේඩර් කුලී හිඟහිටි ශේෂ එකතුව රු. 3,976,766 ක් අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | ඉදිරි කටයුතු කරමින් පවතින බව. | නියමිත පරිදි අයකර ගැනීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වර්ෂ 01 ක සිට වර්ෂ 03ක් දක්වා කාලයක් පැරණි උසාවි දඩ ගාස්තු එකතුව රු. 23,442,162 ක් අයකර නොතිබුණි. | උසාවි දඩ ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලීම් කර ලිපි යවා ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂ 12කට අධික කාලයක් සභාවට අයත් ඉඩම් 17ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිර්දේශ ලබාගෙන ඉඩම් තක්සේරු කිරීම් සිදුකර ගිණුම් ගත කරන බව. | ගිණුම් නිවැරදි ලෙස පිළියෙල කළ යුතුය. |
| (ආ) | බැංකු ජංගම ගිණුමේ පවතින රු.55,728,840ක් වූ ශේෂය ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්ථාවර තැන්පතුවල යෙදවීමට ඉදිරි කටයුතු කරමින් පවතින බව. | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යෙදවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අළුත්වැඩියා කළහැකි වාහන 04ක් පසුගිය වර්ෂ 07 ක සිට 10කට අධික කාලයක සිට අභාවිත තත්ත්වයේ පැවතුණි. | මේ පිළිබඳව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | වාහන අභාවිත තත්ත්වයේ නොතැබීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාවේ භාවිතයේ පවතින එකතුව රු.1,310,000 ක් වූ වාහන 03ක අයිතිය සභාවට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිමිකාරිත්වය මාරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | සභාව සතු වත්කම්වල හිමිකාරිත්වය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තමේන්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදි ආදායම් විෂයන් 04ක සියයට 43 ක සිට සියයට 175ක් දක්වාත්, වැය විෂයන් 06ක සියයට 17ක සිට සියයට 74ක් දක්වා විචලනයන් ද එක් මූලධන වැය විෂයක සියයට 733ක් විචලනයක් ද පැවැති අතර ඒ අනුව අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදී අඩුපාඩු සිදුනොවන අයුරින් සකස් කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළ යුතුය. |

**4.2 පාරිසරික ගැටළු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මෙහෙයුම් සඳහා එකතුව රු. 22,682,412 ක් ගෙවා තිබූ නමුත්, ඝන අපද්‍රව්‍ය රඳවා තිබෙන ස්ථාන සඳහා පරිසර බලපත්‍ර ලබාගැනීමට හෝ කසල වර්ග කර රැස්කිරීමට හෝ ඝන අපද්‍රව්‍ය ප්‍රති චක්‍රීකරණයට ලක්කිරීමට හෝ මේ දක්වා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කසල වර්ග කිරීමටත්, ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට ලක්කිරීමටත්, පරිසර බලපත්‍ර ලබාගැනීමටත් ක්‍රියාමාර්ග ගන්නා බව. | ඝන අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |